# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1144/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 12/07/2024<br>පැය 1320 |

## මාධ්‍ය නිවේදනය

### නෙදර්ලන්තයෙන් ආනයනය කරන ලද ගැහැණු නිළ සුනඛයින් දෙදෙනෙකු පැටවුන් බිහි කිරීමක් - පොලිස් නිළ සුනඛ මූලස්ථානය

2024.07.05 වන දින ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් නිල සුනඛ කොට්ඨාසය වෙත නෙදර්ලන්තයේ සිට නිල සුනඛයින් 35 දෙනෙකු ගෙන්වන ලදි. මේ අතර ගැබ්බර ගැහැණු සුනඛයින් තිදෙනකු සිටි අතර ඉන් ගැහැණු සුනඛයින් දෙදෙනෙකු විසින් පැටවුන් 13 දෙනෙකු දැනට දින කිහිපයකට පෙර මහනුවර කුණ්ඩසාලේ පිහිටි අස්ගිරිය පොලිස් නිල සුනඛ මූලස්ථානයේ දී බිහි කරන ලදි.

පැටවුන් බිහිකරන ලද ගැහැණු සුනඛයින් අතරින් **English Spanier** වර්ගයේ **Tem-pard** යන ගැහැණු නිල සුනඛයා විසින් පිරිමි පැටවු 03ක් සහ ගැහැණු පැටවු 03ක් ද සහ **Lea** යන ගැහැණු නිල සුනඛයා විසින් පිරිමි පැටවුන් 03ක් සහ ගැහැණු පැටවුන් 04 දෙනෙකු වශයෙන් බිහිකරන ලදි. මෙම පැටවුන් නිල සුනඛ කොට්ඨාසයේ සහකාර අධ්‍යක්ෂ පශු වෛද්‍ය අමල් දිසානායක මහතාගේ පරික්ෂාව යටතේ මහනුවර කුණ්ඩසාලේ පිහිටි අස්ගිරිය පොලිස් නිල සුනඛ මූලස්ථානයේ නිරෝගීව සිටී.

නෙදර්ලන්තයේ සිට මෙම නිල සුනඛයින් 35 දෙනා ගෙන්වීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය විසින් විශාල මුදලක් වැය කර ඇති අතර මෙලෙස ගෙන්වන ලද ගැහැණු සුනඛයින් දෙදෙනකු විසින් පැටවුන් 13 දෙනෙකු බිහි කිරීම තුළින් රුපියල් මිලියන 25කට වැඩි මුදලක් ඉතිරි කර ගැනීමට හැකියාව ලැබී ඇත. මින් ඉදිරියෙදි පොලිස් රාජකාරී කටයුතු සඳහා නිල සුනඛයින් ආනයනයන සීමා කරමින් ඒ සඳහා වැයවන පිරිවැය අඩු කිරීම මෙන්ම රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය නිල සුනඛයින් අභිජනනය කර ගැනීමටද අපේක්ෂා කරනු ලබයි.

ඉදිරියේදී මත්ද්‍රව්‍ය පරීක්ෂා කිරීම, අපරාධකරුවන් පසුපස හඹා යාම හා පුපුරණ ද්‍රව්‍ය සොයාගැනීම වැනි කාර්යයන් සඳහා මෙම පැටවුන් පුහුණු කර පොලිස් රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය සහය ලබා ගැනීමට කටයුතු කරනු ලබයි.

නිල සුනඛ පැටවුන්ගේ ඡායාරූප කිහිපයක්





**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**